# මාක්ස්වාදී චින්තනයේ ආර්ථික විග්‍රහය පිළිබඳ විමසුමක්

ආචාර්ය ජී. එම්. හේනේගෙදර

## හැඳින්වීම

විකල්ප ආර්ථික සහ දේශපාලන මතවාදයක් වශයෙන් කාල් මාක්ස් විසින් (1847) විසින් ඉදිරිපත් කරන ලද ද්වීසටනාත්මක භෞතිකවාදය හෙවත් මාක්ස්වාදය පිළිබඳව සවිස්තර විමසුමක් කොට එය වර්තමාන ගෝලීය ආර්ථික සහ දේශපාලන සන්දර්භය තුළ කෙසේ ක්‍රියාත්මකවේ ද යන්න විමසීම මෙම ලිපියේ පරමාර්ථය වේ. එය දර්ශන අංශයේ හිටපු මහාචාර්ය හා පශ්චාත් උපාධි පීඨයේ පීඨාධිපති මහාචාර්ය කුලසේන විදානගමගේ මහතාගේ දාර්ශනික විඥානයට උපහාරයක් ලෙස ඉදිරිපත් කරමි.

මෙම ලිපියේ පරමාර්ථය වන්නේ මාක්ස්වාදය පිළිබඳ කෙටි හැඳින්වීමක් කොට එහි ආර්ථික චින්තනය සහ භාවිතය පිළිබඳ විමසීමක් කිරීමයි. එය සවිස්තරාත්මක දත්ත සහ අනුභූතික සාක්ෂි මත සිදුවිය යුතු අධ්‍යයනයක් වුවත් පවත්නා සීමාකාරීකම් නිසා කෙටි ගුණාත්මක විශ්ලේෂණයකට පමණක් සීමා වී ඇති බව ප්‍රකාශ කරමි. ඒ අනුව මෙම විෂය පිළිබඳව ලියවී ඇති ග්‍රන්ථ සහ වාර්තා පදනම් කරගෙන මෙම ලිපිය සකස් වී ඇත. මූලික වශයෙන් මෙම විශ්ලේෂණය ප්‍රධාන කරුණු 4ක් යටතේ සිදුකෙරේ. ඒ අනුව මාක්සාවාදී දර්ශනයේ හා මාක්ස්වාදයේ පැවැත්ම, නව මාක්ස්වාදී චින්තනය සහ භාවිතය යටතේ කරුණු ඉදිරිපත් කෙරේ.

### 1. මාක්ස්වාදයේ න්‍යායාත්මක පසුබිම

කාල්මාක්ස් හා ෆෙඩ්රික් එංගල්ස් විසින් ධනවාදය අභියෝගයට ලක්කරමින් ඉදිරිපත් කරන ලද මාක්ස්වාදයේ හරය වූයේ ස්වඅභිමතාර්ථය සඳහා කටයුතු කරන ධනපතියන් හෙවත් නිෂ්පාදකයන් විසින් කම්කරුවන් හෙවත් නිර්ධනයන්ගේ අතිරික්ත ශ්‍රම වටිනාකම ලාභ වශයෙන් සූරා ගන්නා බවත් එහි ප්‍රතිඵලයක් වශයෙන් සුළු පිරිසක් අතර ධනය සංකේන්ද්‍රණය වීම නිසා ශ්‍රමය විස්ථාපනය වී (labour displacement) ශ්‍රම අතිරික්තයක් ඇතිවන අතර එමගින් දිළිඳුකම ඇතිවීමත් ඊට එරෙහිව කම්කරුවන් නැගී සිටීමෙන් කම්කරුවන් හා නිෂ්පාදන සම්පත් හිමි ධනපතියන් අතර ඇතිවන අරගලය කම්කරුවන් විසින් දිනා නිෂ්පාදන වාසි අත්කරගන්නා බව ප්‍රකාශ කළ අතර එම ක්‍රියාවලිය කම්කරු විප්ලවය වශයෙන් මාක්ස් හැඳින්විය.

මාක්ස් හා එංගල්ස් විසින් එක්ව 1847 ඉදිරිපත් කරන ලද කොමියුනිස්ට් පක්ෂ ප්‍රකාශනයෙන් හා හා 1867 දී ඉදිරිපත් කරන ලද Das Capital ග්‍රන්ථයෙන් මාක්ස් වාදය පිළිබඳ චින්තනය ඉදිරිපත් කරන ලදී. මාක්ස්වාදයට පදනම් වූයේ ද ශ්‍රමය පිළිබඳ වටිනාකම් න්‍යායයි. ඒ අනුව භාණ්ඩයක නිෂ්පාදන පිරිවැය සම්පූර්ණයෙන්ම තීරණය වන්නේ ඒ සඳහා වැය කරනු ලබන ශ්‍රමය සහ එහි වටිනාකම වූ වැටුප අනුව යැයි සම්භාව්‍ය ආර්ථික විාඥයන් විසින් ධනවාදී ආර්ථික චින්තනය යටතේ ඉදිරිපත් කරන ලද ශ්‍රමය පිළිබඳ වටිනාකම් න්‍යාය මාක්ස් විසින් එලෙසම පිළිගන්නා ලදී. මෙයට හේතුව වූයේ බ්‍රිතාන්‍ය ඇතුළු බටහිර රටවල එවකට පැවති නිෂ්පාදන රටාව යැයි සැලකේ.

මෙකල පැවති නිෂ්පාදන, කර්මාන්ත මූලික වශයෙන් ශ්‍රම සූක්ෂම වූ අතර ළමා සහ කාන්තා ශ්‍රමය භාවිතයේ ඉතා කටොර බව පිළිබඳ බ්‍රිතාන්‍ය ඉතිහාසය සාක්ෂි සපයන බව ආතර් බර්නි (1935) පෙන්වා දෙයි. 1962 දී විලියම් ග්ලැඩ්ස්ටොන් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ දී ප්‍රකාශ කළ පරිදි ධනවතුන්ගේ ධනය වැඩිවන අතර දුප්පතුන්ගේ දුප්පත්කම අඩුවුවත් අන්ත දුප්පතුන්ගේ අඩුවීම ගැන නොදන්නා බව ප්‍රකාශ කිරීම මාක්ස් විසින් තම ග්‍රන්ථය වූ Das Capital මගින් විවේචනය කර තිබේ. මින් පැහැදිලි වන්නේ මාක්ස්ගේ චින්තනය ඉදිරිපත් වූ අවධියේ සීමිත පිරිසක් අතර ධනය සංකේන්ද්‍රනය වී ඒකාධිකාරී තත්වයක් ඇතිව තිබූ බවයි. මේ අනුව මාක්ස් පෙන්වා දුන්නේ නිෂ්පාදකයා විසින් කම්කරුවාට ගෙවන ලද වේතනයට වඩා වැඩි වටිනාකමකින් යුත් ශ්‍රමය කම්කරුවා සපයන බවය. එලෙස නිෂ්පාදකයා විසින් සූරාකනු ලබන ශ්‍රමයේ අතිරික්ත වටිනාකම තුළින් නිෂ්පාදකයා අප්‍රමාණ ලාභ ලබන නිසා ශ්‍රම සූරා කෑමට එරෙහිව කම්කරුවන් විසින් නිෂ්පාදකයන්ට විරුද්ධව නැගී සිටින බව පෙන්වා දුන් මාක්ස් එය කම්කරු විප්ලවයකින් අවසන් වන බව පුරෝකථනය කළේය. මින් මාර්ක්ස්ගේ අරමුණ වූයේ නූතන සමාජයේ ක්‍රියාත්මක වන ආර්ථික චලනය පිළිබඳ න්‍යාය හෙළි කිරීම බව විචාරකයන් පෙන්වා දෙයි.

මිනිස් බලය හා සාමූහික ප්‍රයත්න තුළින් තමන් ජීවත්වන සමාජය වෙනස් කළ හැකි බව මාක්ස්ගේ විශ්වාසය විය. මෙම ප්‍රායෝගික සහ සාමූහික මිනිස් ප්‍රයත්නයන් ලොව සියලුම දේවල පදනම වශයෙන් සිතූ මාක්ස් ඒ අනුව සමස්ත මානව ඉතිහාසයේ පදනම මිනිසාගේ භෞතික නිෂ්පාදන බව අවධාරණය කළේය. එම පදනම වෙනස් කළ හැකි බලවේගය වන්නේ ද මිනිසාට බව මාක්ස් පෙන්නුම් කළේය. ඒ අනුව යථාර්ථය සාමූහික මිනිසා තුළ පවතින අතර එය එක් එක් පුද්ගලයන්ගේ ක්‍රියාකාරකම් කෙරෙහි ද බලපෑම් කරන බව මාර්ක්ස් පෙන්වා දී ඇත (පෙරේරා, ජයන්ත 2012). මාක්ස් වාදය යනු ජර්මන් විඥානවාදී දර්ශනයේ ද, සම්භාව්‍ය ආර්ථික චින්තනයේ ද, ප්‍රංශ දේශපාලනික න්‍යායේ ද සංකල්පයක් බව එංගල්ස් මාක්ස්ගේ අවමංගල්‍යයේ දී පවසා ඇත. විශ්වයේ නියමය හෙළිකරන අයුරින් මාර්ක්ස් විසින් මිනිස් ඉතිහාසය පිළිබඳ විකාශය පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමට උත්සාහ දරා ඇතිබව කාලෝ ෆොන්සේකා පෙන්වා දෙයි (කාලෝ ෆොන්සේකා - 2004).

මාක්ස් වාදය පිළිබඳ ලියවී ඇති ග්‍රන්ථ හා ලේඛන අනුව මාක්ස්වාදයේ හරය ප්‍රධාන අංශ 4 කින් සමන්විත බව පෙනේ.

1. ද්විසට්ටනාත්මක භෞතිකවාදය
2. ඉතිහාසය පිළිබඳ ආර්ථික අර්ථකථනය
3. ධනවාදී ආර්ථික ක්‍රමය පිළිබඳ විශ්ලේෂණය
4. සමාජවාදයට කැපවීම.

## 1.1 ද්වි සට්ටනාත්මක භෞතික වාදය

පාර භෞතික සංකල්පයක් වන ද්විසට්ටනාත්මක භෞතික වාදය විඥාණවාදී දර්ශනයක සංකල්පයකි. ද්වි සට්ටනාත්මක භෞතිකවාදය පිළිබඳ මාර්ක්ස් විසින් ලියා පළකරන ලද ලිපි ලේඛනවල සඳහන් නොවුණත් මාක්ස් විසින් හේගල්ගේ විඥාණවාදී දර්ශනය භෞතිකවාදී සංසිද්ධියක් වන ධනවාදී සමාජය විග්‍රහ කිරීමට පදනම් කරගත් බව පෙනේ. මෙම සංකල්පයෙන් අදහස් කරන්නේ ලෝකය සහ අඩංගු සියල්ල වෙනස්වන බවයි. හේගල්ට අනුව එය සිදුවන්නේ අභ්‍යන්තරයේ පවතින ප්‍රතිවිරෝධ අංග අතර ඇතිවන ගැටුම නිසා සිදුවන වෙනස නිසාය. එය අපෝහක ක්‍රියාවලිය (dialectical process) වශයෙන් හැඳින්වේ. මේ අනුව ද්විසට්ටනාත්මක ක්‍රියාවලියට අනුව විශ්ව මතය හෙවත් සමස්ත ලෝකය ක්‍රමානුකූලව වෙනස් වී අවසානයේ ස්වයං අවබෝධ තත්වයට පත්වේ. මීට සම්බන්ධ ක්‍රියාවලිය ප්‍රවාදය (Thesis), ප්‍රතිවාදය (Antithesis) සහ සහවාදය (Synthesis) වශයෙන් හේගල් විස්තර කර ඇත.

ප්‍රවාදය සහ ප්‍රතිවාදය අතර ගැටුමෙන් ඇතිවන සහවාදය අනිවාර්යයෙන්ම සංවර්ධනයකි. මෙලෙස හේගල්ගේ විඥාණවාදී චින්තනයේ පදනම විශ්ව මතය වුවත් මාක්ස්ගේ චින්තනයේ පදනම වූයේ භෞතිකය හෙවත් පදාර්ථයයි. මේ අනුව භෞතිකයේ පරිණාමය හේතුකොටගෙන සිදුවන සමාජ පරිණාමය පිළිබඳ මාක්ස් අවධානය යොමුකර ඇත.

## 1.2 ඉතිහාසය පිළිබඳ ආර්ථික අර්ථකථනය

ඉතිහාසය පිළිබඳ ආර්ථික අර්ථකථනය හෙවත් ඉතිහාසය පිළිබඳ මාක්ස්ගේ අර්ථකථනය ''දේශපාලන ආර්ථිකය පිළිබඳ විවේචනය'' (Critique of political economy - 1859) නම් ග්‍රන්ථයේ සඳහන් වේ. ඒ අනුව මාක්ස් ප්‍රකාශ කරන්නේ නිෂ්පාදන ක්‍රියාවලියේ නිරතවන මිනිසුන් අතර සමාජ සම්බන්ධතා ඇතිවන්නේ එම නිෂ්පාදන ක්‍රියාවලියේ ස්වභාවය අනුවය. ඒ අනුව යම් සමාජයක පවතින ආර්ථික ව්‍යුහය ඒ සමාජයේ පවතින නෛතික හා දේශපාලනික විධිවිධාන තීරණය කරන බව පෙන්වයි. මින් ප්‍රකාශ කරන්නේ සමාජයක ඇති නිෂ්පාදන ක්‍රියාවලිය (Mode of production) එහි පවත්නා නෛතික, දේශපාලනික හා සමාජ සම්බන්ධතාවල ස්වභාවය පෙන්නුම් කරන බවයි. මේ අනුව සමාජ පැවැත්ම විසින් මිනිසුන්ගේ විඥාණය තීරණය කරන බව පෙන්නුම් කරයි. මේ අනුව මාක්ස් විසින් මිනිස් සමාජ ඉතිහාසය යුග 4 කට බෙදා දක්වයි.,

- වහල් යුගය
- වැඩවසම් යුගය
- වෙළඳ යුගය සහ
- කාර්මික ධනවාදී යුගය

මෙම යුගවල පැවති නිෂ්පාදන ක්‍රම අනුව උසස් සහ පහත් වශයෙන් සමාජ ස්ථර හෙවත් පන්ති බිහිවූ බවත්, නිෂ්පාදන සම්පත්වල හිමිකම අනුව ප්‍රබල සහ දුබල වශයෙන් මෙම සමාජ ස්ථර ක්‍රියාත්මක වූ බවත් මෙම පන්ති අතර ඇතිවන ගැටුම පන්ති ගැටුම වශයෙන් සැලකිය හැකි බවත්

පෙන්නුම් කළේය. මේ අනුව මිනිස් සමාජයේ ඉතිහාසය වනාහි පන්ති සටන් පිළිබඳ ඉතිහාසය යැයි 1848 ප්‍රකාශයට පත් කළ කොමියුනිස්ට් ප්‍රකාශයක සඳහන් කර ඇත. මෙම සමාජ ස්ථර වංශාධිපති රදළයා සහ ප්‍රවේණිදාසයන්, ව්‍යාපාරිකයා හෝ නිෂ්පාදකයා, ශිල්පශ්‍රේණි සහ පුහුණු කාර්මිකයා වශයෙන් ඒ ඒ යුගවලදී වෙනස් වී ඇත. මේ අනුව මෙම උසස් හා පහත් පන්ති අතර ඇතිවන ගැටුම ද්විසට්ටනාත්මක භෞතික ගැටුමක් වශයෙන් මාර්ක්ස් අර්ථ දක්වයි.

මේ පිළිබඳ එංගල්ස්ගේ පැහැදිලි කිරීම අනුව ඉතිහාසය පිළිබඳ භෞතිකවාදී අර්ථකථනයෙන් කියවෙන්නේ අවසාන වශයෙන් මිනිස් ඉතිහාසය තීරණය වන සැබෑ ජීවයේ උත්පාදනය සහ ප්‍රතිඋත්පාදය (Production / Reproduction of real life) බව මහාචාර්ය කාලෝ ෆොන්සේකා ප්‍රකාශ කරයි. (කාලෝ ෆොන්සේකා, 2004)

## 2. ධනවාදී අර්ථක්‍රමය පිළිබඳ විශ්ලේෂණය

මාක්ස්වාදී ආර්ථික විග්‍රහය කරුණු 03ක් යටතේ පැහැදිලි කර ඇත.

1. අතිරික්ත වටිනාකම් පිළිබඳ න්‍යාය
2. ධනය කේන්ද්‍රණය වීම හෙවත් ප්‍රාග්ධන රාශීකරණය
3. පරත්වාරෝපණය සහ පන්ති සටන පිළිබඳ අදහස්

### 2.1 අතිරික්ත වටිනාකම් පිළිබඳ න්‍යාය

රිකාඩෝ ප්‍රමුඛ සමාභාව්‍ය ආර්ථික විiාඥයන්ගේ මූලික සංකල්පයක් වූ ශ්‍රමය පිළිබඳ වටිනාකම් න්‍යාය මත පදනම් වූ අතිරික්ත ශ්‍රම වටිනාකම් සංකල්පය මාක්ස්වාදී ආර්ථික විග්‍රහයේ මූලික පදනම වේ. මාක්ස්ට අනුව ශ්‍රමයේ වටිනාකම භාවිත වටිනාකම සහ හුවමාරු වටිනාකම (exchange value) වශයෙන් කොටස් දෙකකි. භාවිත වටිනාකම වන්නේ, භාණ්ඩයක් නිපදවීමට කම්කරුවා එක්කරන ශ්‍රම වටිනාකම බවත් හුවමාරු වටිනාකම වන්නේ වෙනත් භාණ්ඩයක් සමග හුවමාරු කිරීමේ දී ඇතිවන වටිනාකමයි. ශ්‍රමයේ හුවමාරු වටිනාකම එහි භාවිත වටිනාකමට වඩා වැඩි බව පෙන්වා දෙන මාර්ක්ස් ශ්‍රමිකයා ලබන වැටුපට වඩා වැඩි වටිනාකමක් භාණ්ඩයේ වටිනාකමට එක් කර ඇති බවත් එම අතිරික්ත ශ්‍රම වටිනාකම නිෂ්පාදකයාගේ ලාභය බවට පත්වන බවත් පෙන්වා දේ. මෙය ධනවාදයේ සූරාකෑම වශයෙන් හැඳින්වේ.

උදාහරණ වශයෙන්, ශ්‍රමිකයෙක් දිනකට පැය 10 ක් සේවයෙහි යෙදෙතැයි සැලකුවහොත් ඔහුට ලැබෙන වැටුපෙන් භාණ්ඩ හා සේවා මිලදී ගතහැකි මූර්ත වටිනාකම වන්නේ පැය 5 ක වටිනාකමකට නම් ඉතිරි පැය 5 වටිනාකම ලාභ වශයෙන් නිෂ්පාදකයා සූරාගන්නා බව මාක්ස් පෙන්වා දේ. අතිරික්ත ශ්‍රම වටිනාකම පිළිබඳ අදහස මතභේදයට තුඩු දෙන අතාත්වික මතයක් බව විචාරකයන් පෙන්වා දෙන අතර භාණ්ඩයක වටිනාකම එයට වැය කරන ශ්‍රමය මත පමණක් පදනම් විය නොහැකි බවත් ඒ සඳහා භාවිත වන තාක්ෂණය සහ යන්ත්‍ර සූත්‍රවලට වටිනාකමක් එක්විය යුතු බවත් පෙන්වා දේ. (ආතර් බර්නි, 1935)

2.2 ප්‍රාග්ධන රාශිකරණය (Capital Accumaiation)

මාක්ස්ගේ විග්‍රහයට අනුව අතිරික්ත ශ්‍රම වටිනාකම් තුළින් නිෂ්පාදකයා ලබාගන්නා ලාභ තුළින් ප්‍රාග්ධනය ජනිත වන බවත් එම නිසා වැඩි වශයෙන් ශ්‍රමය සූරාකෑමෙන් අතිරික්තයක් ජනිත කර ලාභ ලබා ගැනීමට කටයුතු කිරීමෙන් ප්‍රාග්ධන සම්පාදනය සිදුවන බවත් පැහැදිලි කෙරේ.

මෙලෙස අතිරික්තය වැඩි කරගැනීමෙන් (ලාභය වැඩිකර ගැනීමෙන්) ප්‍රාග්ධන සම්පාදනය වැඩි කරගැනීමට නිෂ්පාදකයන් පෙළඹෙන අතර ඒ සඳහා යන්ත්‍ර සූත්‍ර යොදා නිෂ්පාදන කාර්යක්‍ෂමතාව වැඩි කිරීමට කටයුතු කරයි. මේ සඳහා ශ්‍රමය ඉවත් කිරීමක් සිදුවන අතර (labour displacement) එමනිසා නිෂ්පාදනයේදී ප්‍රාග්ධන සූක්‍ෂමතාව වැඩිවේ. මේ හේතුවෙන් සූරාකෑම සඳහා ඉතිරි වන්නේ අඩු ශ්‍රමිකයන් පිරිසක් වන අතර එය වැටුප් අඩු කිරීමෙන් හා සේවා කාලය වැඩි කිරීමෙන් සිදුවේ. මෙහි එක් ප්‍රතිඵලය වන්නේ සේවා වියුක්තිය වැඩි වීමයි.

- ප්‍රාග්ධනය ජනිත වීම සහ සංකේන්ද්‍රනය වීම

මාක්ස්ගේ විග්‍රහයට අනුව අතිරික්ත ශ්‍රම වටිනාකම් තුළින් නිෂ්පාදකයා ලබා ගන්නා ලාභ නිසා ප්‍රාග්ධනය ඇතිවන බවත් ඒ නිසා වැඩි වශයෙන් ශ්‍රමය සූරා කෑමෙන් ප්‍රාග්ධන අතිරික්තය ජනනය කොට ලාභාංශ වැඩිකර ගැනීමට නිෂ්පාදකයා කටයුතු කිරීම මගින් ප්‍රාග්ධන සම්පාදනය සිදු කෙරේ. මෙම ක්‍රියාවලිය මාක්ස් විසින් සංකේතවත් කර ඇත.

$m = c - m1$

m = ආයෝජනය කරන ප්‍රාග්ධන ප්‍රමාණය

m1= නිෂ්පාදිත භාණ්ඩ විකිණීමෙන් ලබා ගන්නා ලාභය

c = නිෂ්පාදිත භාණ්ඩ ප්‍රමාණය

## 2.3 පරත්වා රෝපණය සහ පන්ති සටන

**Alianation and class strugle**

පරත්වා රෝපණය යනු සමාජයේ පන්තිවල පවතින යාන්ත්‍රික ස්වරූපය නිසා පුද්ගලයන් මානව ගති ලක්‍ෂණ වලින් ඉවත්වීමයි. එය සිදුවන්නේ තමා නිෂ්පාදනය කළ භාණ්ඩ හෝ භාණ්ඩවල අයිතිය තමාගෙන් ඉවත් වී අතුන් සතුවීමෙනි. මෙය ක්‍රම කිහිපයක් යටතේ සිදුවිය හැක.

- තමා නිපදවන භාණ්ඩවලින් ඉවත් වීම.
- වැඩ කිරීමට ඇති අයිතියෙන් ඉවත් වීම.
- නිෂ්පාදන ක්‍රියාවලියෙන් ඉවත් වීම.
- සහෝදර කම්කරුවන්ගෙන් ඉවත් වීම.
- මනුෂ්‍යාත්වයෙන් ඉවත් වීම.

මෙම ක්‍රියාවලියේ අවසන් ප්‍රතිඵලය පන්ති සටන හෙවත් පන්ති ගැටුම (class conflict) ඇති වී ධනවාදය බිඳවැටීමයි. කම්කරුවන් හා ප්‍රාග්ධන හිමියන් අතර ගැටුම් ඇති වි කම්කරුවන්ගේ තත්වය වඩාත් නරක අතට පත්වේ. සේවා වියුක්තිය, ප්‍රාග්ධන හිමියන් කිහිප දෙනෙක් අතර බෙදී යයි. මෙය ධනවාදයේ ගැටුමක් බවට පත්වී පන්ති සටනක් ඇරඹේ. මාක්ස් පුරෝකථනය කරන පරිදි පන්ති සටන අවසානයේ ප්‍රාග්ධන හිමිකම කම්කරුවන් අතට පත්වන අතර ඉතිහාසයේ බලවේගය වශයෙන් ප්‍රාග්ධන හිමියන් ඉවත් කරනු ලැබේ. ඒ අනුව නිෂ්පාදන සම්පත් කම්කරුවන් සතුවන නව ක්‍රමයක් ලෙස සමාජ වාදය ඇති වේ.

## 2.4 මාර්ක්ස්වාදයේ පැවැත්ම

මාක්ස් පුරෝකථනය කළ පරිදි ධනවාදය සම්පූර්ණයෙන් ම බිඳ වැටී නිෂ්පාදන සම්පත් සම්පූර්ණයෙන්ම කම්කරුවන් සතුවන සමාජවාදී සමාජයක් තවමත් බිහිවී නැත. අතිරික්ත ශ්‍රම වටිනාකම් පිළිබඳ සංකල්පය අනුභූතිකව ඔප්පු කිරීමට නොහැකි වීම හා නිෂ්පාදන ක්‍රියාවලිය නව තාක්ෂණික ක්‍රම අනුව වෙනස් වී ඇති නිසා මාක්ස් පුරෝකථනය කළ සමාජවාදි විප්ලවය මෙතෙක් සිදුවී නැත්තේ මන්දැයි විමසීම වටී. රුසියාව, චීනය හා කියුබාව වැනි රටවල් මාක්ස්වාදී චින්තනය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ රටවල් වුවත් මාක්ස් පුරෝකථනය කළ පරිදි විප්ලවීය වෙනසකට පත්වූයේ නැත. ඒ වෙනුවට සමාජ ප්‍රතිසංස්කරණවාදී ක්‍රියාවන් ඔස්සේ මිශ්‍ර සමාජවාදී ක්‍රමවේදයන් මගින් ආර්ථික අරමුණු ඉටුකර ගැනීමට එම රටවල් වර්තමානයේ ප්‍රයත්න දරමින් සිටී.

කෙසේ නමුත් 1916 රුසියාවේ සිදුවූ කොමියුනිස්ට් විප්ලවය මගින් මාක්ස්වාදී අර්ථක්‍රමයකට පදනම වැටුණත් එය මාර්ක්ස් අපේක්ෂා කළ පරිදි ධනවාදී සමාජය බිඳවැටීමකින් සිදුවූවක් නොවේ. 1916 වනවිට රුසියාවේ එවැනි ධනවාදී සමාජයක් තිබුණේ නැත. සිදුවූයේ ඒකාධිපති සාර් පාලනයෙන් රට මුදවාගෙන මධ්‍යගත සැලසුම් ක්‍රමයකට අනුව රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීමකි. මාක්ස්වාදී යුධ පාලනයේ අමිහිරි අත්දැකීම් නිසා ධනවාදී ආර්ථික ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට 1922 දී ලෙනින් ක්‍රියාත්මක කළත් අපේක්ෂිත පරිදි පන්ති අරගලයක් රුසියාවේ සිදු නොවීම සැලකිය යුත්තකි. කෙසේ නමුත් මධ්‍යගත සැලසුම් ක්‍රමය ධනවාදයට විකල්පයක් වශයෙන් ක්‍රියාත්මක වන්නේ මින් පසුවයි. දශක 3 කට ආසන්න කාලයක් මධ්‍යගත සැලසුම් ක්‍රමය රුසියාවේ ක්‍රියාත්මක වූවත් එමගින් රුසියානු සමාජය තුළ ව්‍යුහාත්මක වෙනසක් සිදුවූයේ නැත. නැගෙනහිර යුරෝපා රටවල්, කියුබාව, වියට්නාමය, චීනය සහ කාම්බෝජය වැනි රටවල් රුසියානු ක්‍රමය අනුගමනය කළ අනෙකුත් රටවල් වේ. එම රටවල ද පරමාදර්ශී මාක්ස්වාදයක් ඇතිවූයේ නැත. 1992 ශීතල යද්ධයෙන් පසු එම රටවල ද ධනවාදී ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලැබේ.

## 3. නව මාක්ස්වාදී චින්තනය

නව මාක්ස්වාදී න්‍යායත් ප්‍රධාන අංශ 02 ක් යටතේ පැහැදිලි කෙරේ.

අධිරාජ්‍ය වාදය (Imperlism)

පරාධීන න්‍යාය (Dependency Theory)

## 3.1 අධිරාජ්‍යවාදය

මාක්ස් ප්‍රකාශ කළ පරිදි ශ්‍රමය සූරාකෑම තුළින් ලාභ උපරිම කිරීමට නිෂ්පාදකයාට නොහැකිවන විට ප්‍රාග්ධනය ලබා ගැනීමේ මාධ්‍යයක් වශයෙන් බාහිර මූලයන් මගින් එය ලබා ගැනීමට උත්සාහ කළේය. මෙය වාණිජවාදය මගින් මුලින් පටන්ගත් අතර පසුව බ්‍රිතාන්‍යය, ප්‍රංශය, ජර්මනිය වැනි රටවල් විසින් ආරම්භ කරන ලද යටත් විජිතවාදී ප්‍රතිපත්ති මගින් ආසියාව, උතුරු අමෙරිකාව, දකුණු අමෙරිකාව හා අප්‍රිකාව යන මහද්වීපවල රටවල් යටත් කරගෙන එම රටවල තිබෙන සම්පත් සූරාකෑම පමණක් නොව මව් රටවල භාණ්ඩ මව් රටවලට රැගෙන ගොස් විකිණීම සහ නිෂ්පාදනය කිරීමද සිදුවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1870 - 90 වැනි කාල වකවානුවලදී යුරෝපානු රාජ්‍යයන් විසින් වර්ග සැතපුම් බිලියන 10 ක භූමි භාගයක් හා මිලියන 150 ක ජනගහණයක් පාලනය කරනු ලැබීය. එනම් ලෝක ජනගහණයෙන් 1/10ක් සිටින සහ ලෝක භූමි භාගයෙන් 1/5 ක් හිමි යුරෝපා රටවල් විසින් ලෝකයේ විශාල බිම් ප්‍රමාණයක් පාලනය කරනු ලැබීය. මෙලෙස ව්‍යාප්ත වූ යටත් විජිත වාදය මගින් ඒකාධිකාරී ලෙස ලෝක සම්පත් සූරාකනු ලැබීය. එසේම වහල් වෙළඳාමෙන් ද ලාභ ලැබීය.

මෙම ක්‍රම 2 මගින්ම ඒකාධිකාරී සූරා කෑම ඉතා පුළුල් ලෙස සිදුවිය. එංගලන්තය, ප්‍රංශය හා ජර්මනිය, පෘතුගාලය වැනි රටවල් ප්‍රධාන වශයෙන් අධිරාජ්‍යවාදී කටයුතුවලට සම්බන්ධ විය. නෙදර්ලන්තය, රුසියාව වැනි රටවල්ද පසුකාලීනව මීට සම්බන්ධවී ඇත.

## 3.2 පරාධීන න්‍යාය

මෙයින් අදහස් කරනුයේ යටත් විජිතවාදයේ ප්‍රතිඵලයක් වශයෙන් පරාධීන බව ඇතිවන බවයි. යුරෝපාකරයේ ඇති වූ සංවර්ධනය යුරෝපා නොවන රටවල ඌණ සංවර්ධනය මගින් ළඟා කර ගැනීම මින් අදහස් කර තිබේ. ප්‍රධාන ගුරුකුල 2 ක් විසින් මේ පිළිබඳව අදහස් දක්වා තිබේ.

1. එක්සත් ජනපදයේ නව මාක්ස්වාදී නයාය
   පිළිබඳ ගුරුකුලය
   (Neo Marksist Thought)

2. ලතින් ඇමරිකානු ගුරුකුලය
   (Latin American Thoughts)

මෙම ගුරුකුල දෙකෙන්ම ඉදිරිපත් කරනු ලැබුවේ කේන්ද්‍ර පරිධිය න්‍යායයි. මෙයින් ප්‍රකාශ කරනු ලැබුවේ ඉහත සඳහන් කළ බටහිර යුරෝපීය රටවල් කේන්ද්‍ර කරගත් දියුණු රටවල් විසින් පරිධියේ පවතින දියුණුවන රටවල් සූරාකෑමට ලක්කරන බවයි.

මොවුන් ප්‍රකාශ කරනුයේ කාර්මික රටවල ධනවාදය ව්‍යාප්ත වීම යනු සත්‍ය හීන කිරීමකි. එනම් දිළිඳු රටවල් සූරාකෑමකි. මේ අනුව මධ්‍යගත කාර්මික රටවල ප්‍රාග්ධන සම්පාදනය පරිධියේ ඇති දියුණුවන රටවල දිළිඳුකම මත පදනම් වී ඇති බව පෙන්නුම් කරයි. මේ අනුව පරිධියේ

රටවල තිබෙන ප්‍රතිලාභ සූරා කෑම මගින් දියුණු රටවල සංවර්ධනය සිදුවන බව පෙන්වා දෙන අතර මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පරිධියේ රටවලට සංවර්ධනය වීමට සම්පත් හිඟකමක් ඇතිවන බව පෙන්වා දෙයි. මෙම න්‍යායෙන් මධ්‍ය විසින් පරිධිය සූරාකනු ලබන බව පෙන්වා දෙන අතර එම සම්බන්ධතාවය නැති නොකරන තුරු දියුණු රටවල සත්‍ය සංවර්ධනයක් ඇති නොකළ හැකි බව පෙන්වා දෙයි.

## 4. භාවිතය

කෙසේ නමුත් වර්තමාන ගෝලීය ආර්ථික සහ දේශපාලන සන්දර්භය තුළ මාර්ක්ස් පෙන්නුම් කළ සූරාකෑම වඩාත් සංවිධානාත්මක සහ පුළුල් ලෙස ජාත්‍යන්තර සෘජු ආයෝජන, ජාත්‍යන්තර ශ්‍රම සංචලනය හා ජාත්‍යන්තර වෙළඳාම තුළින් සිදුවේ. එනම් අතිප්‍රමාණික ලාභ අපේක්ෂාවෙන් ඒකාධිකාරී සහ කතිපයාධිකාරී තත්වයන් මත පාලනය වන ජාත්‍යන්තර ආයෝජන සහ වෙළඳාම් ක්‍රියාවලිය තුළින් ලාභ උපරිම කළ හැක්කේ වඩ වඩාත් අතිරික්තයන් ජනනයකොට සූරාකෑම තුළිනි. සුවිශේෂීකරණය, භාණ්ඩ ප්‍රභේදනය සහ ඒකාබද්ධකරණය තුළින් එම ක්‍රියාවලිය තරඟකාරීව සහ සංවිධානාත්මකව සිදුවේ. මේ නිසා සූරාකෑම තරඟයක් බවට පත්වී ඇති අතර වඩාත් තරඟකාරීවන සමාගම් සහ ආයතන විසින් සූරාකෑම පහසුවෙන් සිදුකරනු ලැබේ. එහෙත් මෙහිදී ප්‍රශ්නය වන්නේ ශ්‍රමය පිළිබඳ වටිනාකම් න්‍යාය මගින් මාර්ක්ස් පෙන්නුම් කළ පරිදි ශ්‍රමයේ අතිරික්ත වටිනාකම සූරාකන්නේ ද යන්නයි. එනම් නවෝත්පාදන සහ තාක්ෂණ දියුණුවත් සමඟ භාණ්ඩයක හෝ නිපැයුමක නිෂ්පාදන කාරයක්ෂමතාවය තීරණය කරන ප්‍රධාන සාධකය බවට තාක්ෂණය පත්වීමයි. තාක්ෂණය ද මානව ප්‍රාග්ධනය තුළින් බිහිවන්නකි. එම අදහසින් ගත් කල ශ්‍රමයේ අතිරික්ත වටිනාකම සූරාකෑම තවදුරටත් රාජ්‍ය මට්ටමෙන් මෙන්ම ජාත්‍යන්තර මට්ටමෙන් ද සිදුවන්නේ යැයි කෙනෙකුට තර්ක කළ හැක. එනමුදු ප්‍රවාහන පහසුකම් දියුණු වීම, සන්නිවේදන ක්‍රමවල දියුණුව සහ අනෙකුත් බාහිර සාධක නිසා ද නිෂ්පාදන කාර්යක්ෂමතාවය වැඩිවීම ද සැලකිල්ලට ගත යුතුය.

කෙසේ නමුත් නිෂ්පාදන සාධකයන් ජාත්‍යන්තර මට්ටමෙන් සූරාකෑමක් දියුණු සහ නොදියුණු රටවල් ආශ්‍රයෙන් මෙන්ම උතුරු සහ දකුණු රටවල් ඇසුරෙන් දැකිය හැක. දේශපාලන සහ ආර්ථික බලයන් දියුණු සහ උතුරේ කේන්ද්‍රගත වූ රටවල් සතුව පවතින අතර මෙම රටවල නිරන්තර මැදිහත්වීමට දකුණේ දියුණුවන රටවල් පත් වෙමින් පවතී. ගෝලීය දේශපාලන සහ ආර්ථික ආයතන මගින් එම තත්වය වඩාත් තාර්කික ලෙස සාධාරණීකරණය කර ඇති අතර බොහෝ දියුණුවන රටවල් දේශපාලන හා ආර්ථික සම්මුති තුළින් එයට එකඟතාවය පලකර ඇත.

මේ අනුව එළඹිය හැකි නිගමනය වන්නේ කාල් මාර්ක්ස් ආපේක්ෂා කළ පරිදි ශ්‍රමය සූරාකෑමට එරෙහිව කම්කරුවන් විසින් ඇතිකරන ඓතිහාසික විප්ලවයෙන් ධනපතියන් හෝ ධනපතිවාදය බිඳවැටීමක් සිදුනොවුණත් ශ්‍රම සූරාකෑම සාධක සූරාකෑම දක්වා ජාත්‍යන්තර මට්ටමින් ව්‍යාප්ත වෙමින් පවතින බවයි. එහෙත් එම ක්‍රියාවලියට විරුද්ධ ශක්තිමත් බලවේගයන් ගොඩනැගී නැත්තේ තවදුරටත් ගෝලීය ආර්ථික සහ දේශපාලන බලය බලවත් දියුණු රටවල් විසින් සිදුකරන නිසයි.

## ආශ්‍රිත ග්‍රන්ථ

Grabowski, Richard. Self, Sharmistha., and Shilelds, P. Michael.2007 Economics Development,New Delhi: Printice Hall of India Private Limited.

Marx, K. 1973, Grundrisse: Introduction to the Critique of Political Economy.Trans, M Nicolaus, Harmondsworth, UK: Penguin.

Peet, Richard andHartwick,Elaine. 2005 Theories of Development, New Delhi:Rawat publication.

Smith, Adam. 1937 (1776). An Enquary into the Nature and Causes of the wealth of Nations, New York: Random House, Medium Library edition.

ෆොන්සේකා, කාලෝ. 2005, විද්‍යාව සහ සමාජවාදයඃ මාර්ක්ස්වාදයට කාලෝචිත ප්‍රවේශයක්, කොළඹඃ ගොඩගේ ප්‍රකාශකයෝ.

මින්ඩෙල්, අර්නස්ට්. 1974. මාක්ස්වාදී ආර්ථීක සංවර්ධනය, කඩවතඃ අශය ප්‍රකාශකයෝ.